**පලාගල ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ එහෙත් 2016 වර්ෂයේදී නිරවුල් කර තිබුණු එකතුව රු.159,320 ක්වූ වියදම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ කටයුතු සඳහා භාවිතා කර තිබූ වාහන 8 ක් සඳහා ගෙවිය යුතු රු.51,300 ක ආදායම් බලපත්‍ර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා දුරකථන කුළුණු 05 කින් අයවියයුතු රු.93,000 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සභාව නමින් ලියාපදිංචි අයිතිය පවරා නොගත් එකතුව රු.5,644,580 ක්වූ වාහන තුනක්, ස්ථාවර වත්කම් ලෙස මෝටර් රථ වාහන හා කරත්ත ගිණුමට ඇතුළත් කර තිබුණි.

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.4,104,194 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.2,238,943 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **වරිපනම් බදු**

සභා බලප්‍රදේශයේ පිහිටි සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **බදු කුලී**

2011,2012 හා 2013 වර්ෂවලට අදාලව ලැබිය යුතු රු. 99,100 ක්වූ හිඟ හිටි බදුකුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.4,393,718 ක්වූ උසාවි දඩ ආදායම අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර, 2014 වර්ෂය අවසන් වන විට හිඟව පවතින රු.687,975 ක්වූ මුද්දර ආදායම අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**2.2.4** **වෙනත් ආදායම්**

දුරකථන කුළුණු 4 ක් සඳහා අයවියයුතු රු.90,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **බලය නොලත් ගනුදෙනු**

සමාලෝචිත වර්ෂය තුල ජර්නල් සටහන් 20 ක් මගින් සිදුකර තිබුණු රු.64,116,566 ක්වූ ලෙජර් ගිණුම් අතර ගැලපීම්වලට අදාලව විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව නමින් ලියාපදිංචි අයිතිය පවරා නොගත් හා ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර නොතිබුණු එකතුව 13,460,316 ක්වූ වාහන 04 ක් සභාවේ දෛනික කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.

(ආ) ලැබියයුතු ගිණුම්වල දක්වා තිබෙන 2010, 2011 හා 2012 වර්ෂ තුළ ක්‍රියාත්මක කරන ලද ගම නැගුම සංවර්ධන ව්‍යාපෘති 6 කට අදාළ රු.499,099 ක මුදල නිශ්චිතව හඳුනාගෙන අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ගෙවියයුතු ගිණුම්වල දක්වා තිබෙන 2010, 2011 හා 2012 වර්ෂ තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති 11 කට අදාළ රු.602,477 ක ගෙවියයුතු මුදල් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 127 ප්‍රකාරව කවර හෝ වැය සම්මතයක් සීමාව ඉක්මවා යනු ලබන්නේ නම්, පරිපූරක වැය සම්මතයක් සඳහා සභාවේ පූර්ණ අනුමැතිය ලබාගතයුතු වුවත්, රු.4,665,000 ක මුදලක්, අනුමැතියකින් තොරව වැය ශීර්ෂ අතර මාරු කර තිබුණි.

(ඉ) (203 වන අධිකාරිය) මෝටර් වාහන පනතේ 2(1) වන වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමකින් තොරව වාහන භාවිතා කළ නොහැකි වුවද, සභාව විසින් ඊට පටහැනිව කටයුතු කරමින් වාහන දෙකක් ධාවනයේ යොදවා තිබුණි.

## 3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---------------------------

2015 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ රු.6,547,207 ක මුදලක් ලැබී තිබූ අතර, 2015 වර්ෂය අවසන් වන විට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව අනුමත ව්‍යාපෘති 22 ක වැඩ නිමකළ බවට බිල්පත් ඉදිරිපත් කර තිබූ නමුත්, රු.4,170,000 ක් වූ ව්‍යාපෘති 7 ක වැඩ 2016 මාර්තු 28 දින වන විටත් අවසන් කර නොතිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

පළාත්පාලන මාර්ග හා පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2014 යටතේ මාර්ග 07 ක් බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන 5 ක් සමඟ ගිවිසුම්වලට බැඳී තිබුණි. එකී ගිවිසුම් පරිදි එම කර්මාන්ත 2014 දෙසැම්බර් 31 දිනට පෙර වැඩ නිමකර සභාවට භාරදීමට එකඟ වී තිබූ නමුත්, ගිවිසුම් පරිදි වැඩ නිමකර භාර නොදීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ 4 වගන්තිය පරිදි ප්‍රමාද ගාස්තු වශයෙන් රු.264,165 ක මුදලක් එකී කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**04.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය